**වැලිගම නගර සභාව**

**මාතර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 06 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 නොවැම්බර් 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 නොවැම්බර් 29 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති වැලිගම නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ ගබඩාවෙන් නිකුත් කරන ලද රු.1,799,695 ක් වූ භාණ්ඩවල වටිනාකම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය වෙනුවෙන් පළාත් සභා මුද්දර ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂය තුල ලැබුණු රු.2,876,640 ක මුදල ආදායමට නොගෙන ආපසු ගෙවිය යුතු මුද්දර තැන්පත් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) සමලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ජර්නල් සටහන් 101 ක් ඉදිරිපත් කර තිබුණද ප්‍රධාන ලෙජරයෙහි ජර්නල් සටහන් 109 ක් වූ අතර ජර්නල් සටහන් 08 ක සටහන් නොවූ ගනුදෙනු වටිනාකම රු.1,248,668 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.16,293,463 ක් වූ තොගය වර්ගීකරණයකින් තොරව පොදු ගබඩා යටතේ ගිණුම් ගතකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල ලැබුණු රු.3.566,793 ක් වූ බදු කුලිය මුදල් පොත හර කොට බදු කුලී පාලන ගිණුම බැර නොකිරීම හේතුවෙන් එකී ප්‍රමාණයෙන් ණය ගැතියන් වැඩිවී තිබුණි.

---

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට වැටුප් රහිත නිවාඩු වටිනාකම වූ රු.376,025 ක මුදල අවසාන ගිණුමෙහි ණයගැතියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණ.

(උ) නිලධාරීන් හතර දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය රජයේ දායකය ලෙස ගෙවන ලද රු.206,003 ක දේපල ණය පොලී මුදල ණයගැතියන් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

1.3.2 නිරවුල් නොකළ ගිණුම්

ගිණුම් විෂයයන් 11 කට අදාල රු.88,956,593 ක වූ ශේෂයන් නිරවුල් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදීද ඉදිරියට ගෙන ගොස් තිබුණි.

1.3.3 බැංකු ගිණුම්

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 387 ප්‍රකාර බැංකු ගිණුම්වල අයිරාවක් පවත්වාගෙන යා නොහැකි වුවද මුදල් පොත අනුව බැංකු ගිණුම් 04 ක අයිරා පවත්වාගෙන යමින් තිබුණි.

(ආ) බැංකු ගිණුම් තුනකට අදාලව 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවත එන රු.2,795,569 ක වටිනා බැංකු වැරදි අඩු කලා ලෙසට දක්වමින් නිවැරදි කිරීමකින් තොරව බැංකු සැසඳුම්වල දක්වා තිබුණ.

(ඇ) බැංකු ගිණුම් දෙකකට අදාලව 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ඉදිරියට ගෙන එමින් පැවති රු.3,211,173 ක වටිනා හඳුනා නොගත් බැංකු වැරද අඩුකලා ලෙසට දක්වමින් අදාල ගැලපීම් කිරීමකින් තොරව බැංකු සැසඳුම් වල දක්වා තිබුණි.

(ඈ) බැංකු ගිණුම් හතරකට අදාල 2011 ජනවාරි මාසයේ සිට 2012 සැප්තැම්බර් දක්වා තැන්පත් කල රු.1,433,960 ක් වටිනා චෙක්පත් 25 ක් උපලබ්ධි වී නොතිබූ අතර අදාල ණයගැති ගිණුම් ගැලපීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු සැසඳුමේ දක්වා තිබුණි.

(ඉ) නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ රු.1,881,537 ක් වටිනා චෙක්පත් 49 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

1.3.4 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 12 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනව ශේෂයන්ගේ එකතුව රු.104,660,547 ක් වූ අතර උපයෝගී ලේඛණ අනුව හා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ගිණම් ශේෂයන්ගේ එකතුව රු.98,468,638 ක් වූයෙන් වෙනස රු.6,191,909 ක් විය.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණම් ශේෂවල වටිනාකම රු.90,795,650 ක් විය.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.246,879,661 ක් වූ ගනුදෙනු 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.8,799,151 ක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 7,362,119 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේනතුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | 7,075 | 7,226 | 4,389 |
| (ii) | බදු කුලී | 13,440 | 11,259 | 6,127 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,005 | 804 | 336 |
| (iv) | වෙනත් ආදායම් | 60,540 | 61,745 | 85,749 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 50,000 |
| (ii) | මුද්දර ගාස්තු | 3,000,000 |

සභාව වෙත දකුණු පළාත් සභාවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු වර්ෂ ගණනාවක් තිස්සේ නිසියාකාරව නොලැබීම නිසා සභාවේ සංවර්ධන කටයුතු වලට බාධා ඇති වී තිබෙන බවත් සභාව විසින් දැරිය යුතු වියදම් සඳහා මුදල් නොලැබීම මත අයිරා ලබාගැනීමෙන් අයිරා පොලී ගෙවීමට සිදුවී තිබුණි.

2.2.3 වරිපනම් බදු

පහත සඳහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ හිඟහිටි වරිපනම් බදු මුදල් අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 170 වගන්තිය පරිදි සභා ලේකම්වරයා කටයුතු කල යුතු විය. 2012 වර්ෂයේ හිඟහිටි වරිපනම් බදු මුදල් අයකර ගැනීම සඳහා ආදායම් පරීක්ෂවකරයාව භාරදුන් ලැයිස්තු වල වටිනාකම ඒවායින් එකතුකල මුදල, ගෙවන ලද කොමිස් මුදල යනාදී තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ 2012 දෙසැම්බර් 31 දනට රු.10,000 ට වැඩි හිඟහිටි බදු සහිත දේපල 39 කින් දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙනා රු.589,929 ක හඟ මුදල් අයකර ගෙන නොතිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් බදු මුදල රු.2,744,779 වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට එකී හිඟය රු.6,125,936 ක් වී තිබුණි. හිඟ හිටි මුදල් අයකර ගැනීමට බලය පවරා තිබූ ආදායම් පරීක්ෂකවරයා 2012 වර්ෂයේ එකතු කරගත් ආදායම රු.354,255 ක් තරම් සුළු අගයක් විය.

2.2.4 දුරකථන කුළුණු ගාස්තු

සභා බල ප්‍රදේශයේ ඉදිකර ඇති දුරකථන කුළුණුවලින් ගාස්තු අයකිරම සඳහා 2012 අප්‍රේල් 20 දිනැති අංක 1755 දරන ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනයෙන් 2012 වර්ෂය සඳහා එක් කුළුණකින් රු.50,000 ක ගාස්තුවක් අයකිරීමට අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

සභාවේ ආදායම් පරීක්ෂකවරයාගේ 2013 ඔක්තෝබර් 07 දිනැති ලිඛිත ප්‍රකාශය අනුව වැලිගම ලංකා බැංකුව පිටුපස ඉදිකර තිබූ දුරකථන කුළුණ 2012 වර්ෂයේ භාවිතයට ගෙන තිබුණෙන් වර්ෂයකට රු.50,000 මුදලක් අයකර ගත යුතු වුවද එකී මුදල අයකර ගෙන නොතිබුණි.

2.2.5 අවිධිමත් ගනුදෙනු

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ 2005 ඔක්තෝබර් 05 දිනැති අංක 1413/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනයේ 3 රීතිය (1)(1) අනුව අදාල මාසයේ පවත්වන ලද සභා රැස්වීම සහ කාරක සභා රැස්වීම් වලට සහභාගී වී නොමැති මන්ත්‍රීවරුන් සඳහා දීමනා නොගෙවිය යුතු වුවද රැස්වීම් වලට සහභාගි නොවූ මන්ත්‍රීවරු 07 ක් සඳහා 2012 වර්ෂයේ දී සභික දීමනා ලෙසට රු.68,000 ක මුදලක් ගෙවා තබුණි.

තවද මන්ත්‍රීවරු, 3 රීතියේ (i) (iii) ඡේදය පරිදි වෛද්‍ය හේතූන් මත නිවාඩු ලබා ගැනීම හෝ 3 රීතිය (2) ඡේදය පරිදි විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබූ බවද නිරීක්ෂණය විය.

2.3 වත්කම් කළමනාකරණය

ලැබිය යුතු ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.7,068,505 ක් විය.

2.4 මානව සම්පත් කළමනාකරණය

(අ) 2012 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 113 දෙනෙක්ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 154 දෙනෙක්ද විය.

(ආ) 2002 ජනවාරි 03 දිනැති අංක 14 හා 2006 අප්‍රේල් 10 දිනැති හා අංක 28 දරන කළමණාකරන සේවා චක්‍රලේඛ මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයන් බඳවාගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 37 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සභා අරමුදලින් රු.4,073,442 ක මුදලක් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකළහොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරණය කර තිබුණි

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) නව නගර ශාලාව සහ නගර සභා කාර්යාලය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේදී සියයට 9 ක පොලිය යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබූ රු.29,010,467 ක ණය මුදලේ සමාලෝචිත වර්ෂය අවසානයට ණය වාරික 2011 වෙන කාර්තුව දක්වා පමණක් ගෙවා තිබූ අතර එදිනට රු.6,645,258 ක් ගෙවීමකින් තොරව හිඟව පැවතිණ.

(ආ) උප සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් 9 දෙනෙකු හා නිලධාරීන් දෙදෙනෙකු සමාලෝචිත වර්ෂයට අදාල වත්කම් බැරකම් ප්‍රකාශ 2013 ඔක්තෝබර් 07 දින වන විටද ලබාදී නොතිබුණි.

(ඇ) 1997 සිට 2010 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.3,433,090 ක විගණන ගාස්තු 2013 අගෝස්තු 13 දින වන විටත් ගෙවා නොතිබුණි.

---

3. <u>පද්ධති හා පාලන</u>

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ගබඩා පාලනය